# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024 (2025) සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍රය

අධ්‍යාපන අමාත්‍යාංශය - කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව

| කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | 81 | S | I, II | පැය තුනයි |
|---|---|---|---|---|

**උපදෙස් :**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

1. බිත්තර වීවල තිබිය යුතු අවම ප්‍රරෝහණ ප්‍රතිශතය හා උපරිම තෙතමන ප්‍රතිශතය වන්නේ,
   (1) 80% හා 15% කි. (2) 90% හා 13% කි. (3) 85% හා 13% කි. (4) 75% හා 10% කි.

2. මාස 4½ වයස් කාණ්ඩයට අයත් වැඩි දියුණු කළ වී ප්‍රභේදයකි
   (1) Bg 300 (2) Bg 350 (3) Bg 360 (4) Bg 450

3. ශරීර ස්කන්ධ දර්ශකය (BMI) අනුව ආසියතික රටවල පුද්ගලයින්ගේ කායික යෝග්‍යතාව සැලකීමේ දී ස්ථුලතාව ලෙස ගැනෙනුයේ, BMI අගය
   (1) 27ට වැඩි වූ විට දී ය. (2) 24 - 25 අතර දී ය. (3) 23ට අඩු වූ විට දී ය. (4) 25 වූ විට දී ය.

4. පහත සඳහන් A හා B ලෙස දක්වා ඇති ආහාර නිෂ්පාදන ක්‍රියාවලි සඳහා වැදගත් වන ආහාරවල 'අගය එකතු කිරීමේ' ක්‍රම නිවැරදිව පිළිවෙලින් සඳහන් පිළිතුර තෝරන්න.
   A - කිරිපිටිවලට විටමින් එකතු කිරීම
   B - ලුණුවලට අයඩීන් එකතු කිරීම

   (1) ප්‍රබල කිරීම, සරු කිරීම (2) සරු කිරීම, අවම සැකසීම
   (3) සරු කිරීම, ප්‍රබල කිරීම (4) අවම සැකසීම, ප්‍රබල කිරීම

5. පරිණත අවධියට පසුව අස්වනු නෙළීම නිසා තන්තුමය ස්වභාවය වැඩි වීමෙන් පරිභෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වන බෝග අයත් පිළිතුර තෝරන්න.
   (1) අඹ, කෙසෙල්, තක්කාලි (2) කරවිල, වට්ටක්කා, පැපොල්
   (3) බණ්ඩක්කා, මෑ, වැටකොලු (4) ගෝවා, අර්තාපල්, මාළුමිරිස්

6. වියළි කලාපීය බඩ ඉරිඟු වගාවක පොටෑසියම් (K) ඌනතාවයේ දී දැකගත හැකි ලක්ෂණයකි
   (1) පත්‍ර පහසුවෙන් හැලීම. (2) මේරූ පත්‍ර දම් පැහැ වීම.
   (3) පත්‍ර දාරයේ පිළිස්සුණු ස්වභාවයක් පැවතීම. (4) ශාක කුරු ස්වභාවයක් ගැනීම.

7. අධික සුළං සහිත වියළි පරිසර තත්ත්ව යටතේ උස් බිම් වගාවකට යෙදීමට වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමය වන්නේ
   (1) ඇලි ජල සම්පාදනය ය. (2) ඉසින ජල සම්පාදනය ය.
   (3) බින්දු ජල සම්පාදනය ය. (4) තීරු ජල සම්පාදනය ය.

8. කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මය පිළිබඳව සත්‍ය ප්‍රකාශය කුමක් ද
   (1) කොම්පෝස්ට් පොහොර සෑදීමේ දී දැව අළු යෙදීම අත්‍යවශ්‍ය වේ.
   (2) වැටමාර පත්‍ර අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීමෙන් කොම්පෝස්ට් පොහොරවල පොටෑසියම් ප්‍රතිශතය අධික වේ.
   (3) සත්ත්ව මළ ද්‍රව්‍ය යෙදීමෙන් කොම්පෝස්ට් පොහොරවල පොස්පරස් ප්‍රතිශතය වැඩි වේ.
   (4) කෙසෙල් ලෙලි යෙදීමෙන් කාබනික පොහොරවල පොටෑසියම් ප්‍රතිශතය වැඩි වේ.

(දෙවැනි පිටුව බලන්න)

9. ‘පොහොර භාවිත කාර්යක්ෂමතාව’ යනු, බෝගයේ අවශ්‍යතාව අනුව,
(1) යෙදිය යුතු පොහොර ප්‍රමාණය එකවර ක්ෂේත්‍රයට යෙදීම ය.
(2) රසායනික හා කාබනික පොහොර ඒකාබද්ධව ක්ෂේත්‍රයට යෙදීම ය.
(3) යොදන පොහොර බෝගය විසින් ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව ය.
(4) අවශ්‍ය පොහොර එකවර ක්ෂේත්‍රයට නොයොදා කිහිපවරකට යෙදීම ය.

10. රූපාකාරය අනුව වල්පැළෑටි වර්ගීකරණය යටතේ ගැනෙන ‘තෘණ’ වර්ග සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) පත්‍රවල ජාලාකාර නාරටි වින්‍යාසයක් දැක ගත හැකි ය.
(2) කඳ සිලින්ඩරාකාර වන අතර එහි හරස්කඩක සිදුරක් දැකිය හැකි ය.
(3) තෘණ පත්‍රවල දිශා තුනකට විහිදී ගිය පත්‍රිකා තුනක් දැකිය හැකි ය.
(4) කඳ අග්‍රස්ථයේ හා පාර්ශ්වික අතුවල පුෂ්ප මංජරි දැකිය හැකි ය.

11. කුකර්බිටේසියේ සහ සොලනේසියේ කුලයේ බෝගවලට හානි කරන පළිබෝධයෙකු වන එපිලැක්නා කුරුමිණියාගේ හානිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) හානි සිදු කරනු ලැබූ පත්‍රය දැලක් මෙන් දිස් වේ.
(2) කීට අවධියේ දී පමණක් ශාකවලට හානි සිදු කරයි.
(3) ෆෙරමෝන උගුලක් භාවිත කර පහසුවෙන් පාලනය කළ හැකි ය.
(4) ඵල ආවරණය කිරීම මගින් පළිබෝධයින් පාලනය කළ හැකි ය.

12. පහත දැක්වෙන්නේ බෝග ශාකවලට බහුලව වැළඳෙන රෝග කීපයකි. ඒවායේ රෝග කාරකයා සහ හානියේ ස්වභාවය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | රෝගය | රෝග කාරකයා | බෝගවලට සිදු කරන හානිය |
|---|---|---|---|
| (1) | පත්‍ර විචිත්‍රය | දිලීර | ශාක පත්‍ර කුණු වීම |
| (2) | ඇන්ත්‍රැක්නෝස් | දිලීර | පත්‍ර හා ඵල මත කළු පුල්ලි ඇති වීම |
| (3) | හිටු මැරීම | වෛරස | ශාක මලානික වීම |
| (4) | දියමලන්කෑම | බැක්ටීරියා | ළපටි ශාක කුණු වීම |

13. ‘ෆයිටොප්ලාස්මා’ ආසාදනය වූ ශාකවල නිරීක්ෂණය කළ හැකි ලක්ෂණයක් විය හැක්කේ,
(1) පුෂ්ප වෙනුවට කොළ පැහැති පත්‍ර සෙව්වන්දියක් ඇති වීම ය.
(2) ශාක කඳෙහි විවිධ වර්ණයෙන් යුත් ලප දැකිය හැකි වීම ය.
(3) ශාකයේ තෙත් හෝ වියළි කුණුවීම් තත්ත්වයක් දැක ගත හැකි වීම ය.
(4) ශාක පත්‍රවල දුඹුරු පැහැති පුල්ලි ඇති වීම ය.

14. ඉන්දීය ගව වර්ගවල විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) සම ශරීරයට තද වී පැවතීම ය.
(2) මොල්ලිය මනාව වර්ධනය වී තිබීම ය.
(3) වැඩි පරිසර උෂ්ණත්වවලට ඔරොත්තු නොදීම ය.
(4) කිරි නිෂ්පාදනය, යුරෝපීය ගව වර්ගවලට වඩා සාපේක්ෂව වැඩි වීම ය.

15. පහත සඳහන් වරණ අතරින් ගව වර්ගය හා ලබා ගන්නා ප්‍රයෝජනය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
(1) සින්දි - කිරි සඳහා ඇති කරන ඉන්දීය ගව වර්ගයකි.
(2) ජර්සි - මස් සඳහා ඇති කරන යුරෝපීය ගව වර්ගයකි.
(3) තිලිරවි - බර ඇදීම සඳහා යොදා ගන්නා ඉන්දීය ගව වර්ගයකි.
(4) සහිවාල් - මස් සඳහා ඇති කරන ඉන්දීය ගව වර්ගයකි.

16. පහත ගව වර්ග අතරින් එක් මුරයක දී වැඩිම කිරි ප්‍රමාණයක් ලබා දෙන ගව වර්ගය වන්නේ,
(1) අයර්ෂයර් ය. (2) ෆ්‍රීෂියන් ය. (3) ඔස්ට්‍රේලියානු මිල්කින් සීබු (AM2) ය. (4) ජර්සි ය.

17. දැනට ශ්‍රී ලංකාවේ කුකුළන් ඇති කිරීම සඳහා බහුල වශයෙන් යොදා ගනු ලබන ක්‍රමය කුමක් ද?
(1) තට්ටු ක්‍රමය (2) කූඩු ක්‍රමය (3) ඝන ආස්තරණ ක්‍රමය (4) අඩ සියුම් ක්‍රමය

(තුන්වැනි පිටුව බලන්න)

18. බ්‍රොයිලර් සතුන් ලෙස ඇති කිරීම සඳහා දිනක් වයසැති කුකුළු පැටවුන් අලෙවි කිරීමේ දී, එම සතුන්ට අනිවාර්යයෙන්ම එන්නත් කරනු ලැබේ. එම එන්නත් ලබා දෙනුයේ කුමන රෝගය වැළැක්වීම සඳහා ද?
(1) රැනිකට් (2) බ්‍රොන්කයිටීස් (3) ගම්බෝරෝ (4) පුල්ලෝරම්

19. පහත වගුවේ දැක්වෙනුයේ ශාක කුල හා එම කුලවලට අයත් බෝග වේ. නිවැරදි ගැලපීම ඇති පිළිතුර තෝරන්න.

| | ශාක කුලය | අයත්වන බෝග |
|---|---|---|
| (1) | ඇරිකේසියේ | පොල්, කිතුල්, පුවක් |
| (2) | පොඒසියේ | කව්පි, බෝංචි, දඹල |
| (3) | ෆැබේසියේ | බඩ ඉරිඟු, කුරක්කන්, තණ හාල් |
| (4) | බ්‍රැසිකේසියේ | ලූණු, ලීක්ස්, සුදු ලූණු |

20. 

ඉහත රූපයේ දැක්වෙන උපකරණය භාවිතයෙන් සංස්ථාපනය කරන බෝග වන්නේ,
(1) තල, මුං, බඩ ඉරිඟු, වී ය.
(2) මිරිස්, බඩ ඉරිඟු, කැරට්, කව්පී ය.
(3) කව්පී, සෝයා බෝංචි, මුං, බඩ ඉරිඟු ය.
(4) කරවිල, බණ්ඩක්කා, බඩ ඉරිඟු, මිරිස් ය.

21. තවාන් පාත්තියක පැළ ගැලවීමේ දී අනුගමනය කරන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.
A - අත් මුල්ලුව මගින් පේළි අතර පස් බුරුල් කිරීම
B - තවාන් පාත්තිය ජලයෙන් හොඳින් තෙත් කිරීම
C - මුල් නොකැඩෙන සේ පස් කුට්ටිය සමග පැළ ඉවත් කිරීම

මෙම කාර්ය සිදු කළ යුතු නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර වන්නේ,
(1) A, B හා C ය. (2) A, C හා B ය. (3) B, A හා C ය. (4) B, C හා A ය.

22. බෝග වගා කිරීමේ දී බොහෝ විට වසුන් යෙදීම සිදු කෙරේ. වසුන් යෙදීම පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරා දක්වන්න.
(1) වසුන් යෙදීමෙන් පසේ ඇති ජලය වාෂ්පීකරණය වැඩි වේ.
(2) වසුන් යෙදීම නිසා අහිතකර පාංශු ජීවීන් විනාශ වේ.
(3) වසුන් යෙදීමෙන් පාංශු ඛාදනය අඩු වී වල් පැළ පාලනය ද වේ.
(4) වසුන් යෙදීම නිසා පොහොර යෙදීම පහසු වන නමුත් වල්පැළ පාලනය අපහසු වේ.

23. අතීතයේ ශ්‍රී ලංකාවේ රජරට රාජධානිය පිරිහීමත් සමග ජනාවාස නිරිත දිශාවට සංක්‍රමණය වීම නිසා කෘෂිකර්මාන්තයේ සිදු වූ ප්‍රධානතම වෙනස්කම වන්නේ,
(1) කුඩා වැව්වලට අමතරව මහ වැව් තැනීම ය.
(2) වැව් ආශ්‍රිත කෘෂිකර්මය වෙනුවට වර්ෂා ජලයෙන් ගොවිතැන් කිරීමට යොමු වීම ය.
(3) වී ගොවිතැන කෙරෙහි ගොවි ජනතාව වැඩි වශයෙන් යොමු වීම ය.
(4) වී ගොවිතැනට රාජ්‍ය අනුග්‍රහය ලැබීම ය.

(හතරවැනි පිටුව බලන්න)

**24.**




වියළි කලාපයේ මාසික වර්ෂාපතන ව්‍යාප්තිය

මෙම ප්‍රස්තාරය අනුව ජූලි, අගෝස්තු මාසවල එම කලාපය තුළ සිදු කිරීමට වඩාත්ම ඉඩ ඇති කෘෂිකාර්මික කටයුත්ත වන්නේ,
(1) යල කන්නයේ වී වගාව සඳහා බිම් සැකසීමයි.
(2) යල කන්නයේ වී අස්වනු නෙළීමයි.
(3) මහ කන්නයේ වී වගාව සඳහා බිම් සැකසීමය.
(4) මහ කන්නයේ වී අස්වනු නෙළීමයි.

**25.** මිනිසුන්ගේ අස්ථි සහ දත්වල දුර්වලතා ඇති වීමට **අඩුම** බලපෑමක් ඇති කරනුයේ,
(1) යකඩ ඌනතාවයි.
(2) පොස්පරස් ඌනතාවයි.
(3) කැල්සියම් ඌනතාවයි.
(4) විටමින් D ඌනතාවයි.

**26.** ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප අනුව මුහුදු මට්ටමේ සිට 500m උසකින් පිහිටි වාර්ෂික වර්ෂාපතනය 2000mm වන ප්‍රදේශ හැඳින්වීමට සුදුසු සංකේතය වන්නේ,
(1) WL ය. (2) IM ය. (3) IL ය. (4) DL ය.

**27.** කිරිගරුඬ නම් පාෂාණ සෑදී ඇත්තේ,
(1) ආග්නේය පාෂාණ විපරීත වීමෙනි.
(2) අවසාදිත පාෂාණ විපරීත වීමෙනි.
(3) ආග්නේය පාෂාණ අවසාදනය වීමෙනි.
(4) විපරීත පාෂාණ අවසාදනය වීමෙනි.

**28.** බෝගවලට සුදුසු පාංශු තෙතමන තත්ත්ව පවත්වා ගැනීම සඳහා ජලසම්පාදනය කළ යුතු ආකාරය දැක්වෙන වඩාත් සුදුසු ප්‍රකාශය තෝරා දක්වන්න.
(1) ක්ෂේත්‍ර ධාරිතාවේ දී සංතෘප්ත අවස්ථාව දක්වා ජලය සැපයීම
(2) තාවකාලික මැලවීමේ දී සංතෘප්ත අවස්ථාව දක්වා ජලය සැපයීම
(3) තාවකාලික මැලවීමේ සිට ක්ෂේත්‍ර ධාරිතාව දක්වා ජලය සැපයීම
(4) ස්ථිර මැලවීමේ දී සංතෘප්ත අවස්ථාව දක්වා ජලය සැපයීම

**29.** පහත සඳහන් ප්‍රකාශ අතරින් පාංශු තෙතමන මට්ටම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරා දක්වන්න.
(1) අධික වර්ෂාවකින් පසු පසෙහි මහා අවකාශවල ඇති ගුරුත්වාකර්ෂණ ජලය ඉවත් වී පස ක්ෂේත්‍ර ධාරිතා තත්ත්වයට පත් වේ.
(2) ශාක මගින් අවශෝෂණය කර ගනු ලබන්නේ පසේ ක්ෂුද්‍ර අවකාශවල ඇති කේශාකර්ෂණ හා ජලාකර්ෂණ ජලය වේ.
(3) ස්ථිර මැලවීමේ අවස්ථාවේ ඇති පසක ඇත්තේ කේශාකර්ෂණ ජලය හා ජලාකර්ෂණ ජලය පමණි.
(4) සංතෘප්ත තෙතමන මට්ටමේ පවතින පසක ක්ෂුද්‍ර අවකාශ වාතයෙන් ද, මහා අවකාශ ජලයෙන් ද පිරී පවතී.

**30.** විශේෂිත තත්ත්ව යටතේ ආහාර ඇසුරුම් කිරීමේ විවිධ ක්‍රම මගින් පාරිභෝගිකයාට සැළසෙන වාසි පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) අපූති තත්ත්ව යටතේ දී ආහාරයේ එන්සයිමීය ක්‍රියා සම්පූර්ණයෙන්ම නැවැත්විය හැකි වේ.
(2) ඇසුරුමකට යොදනු ලබන නයිට්‍රජන් සංයුතිය වැඩි කිරීමෙන් ආහාරයේ දිලීර වර්ධනය වැඩි වේ.
(3) මස් සහ රටඉඳි වැනි ආහාර සඳහා රික්ත ඇසුරුමක් යෙදීමෙන් ආහාරයේ තෙතමනය ඉවත් වේ.
(4) ජීවානුහරිත තත්ත්ව යටතේ අසුරණ ලද ආහාර ශීතකරණ තුළ ගබඩා කිරීම අවශ්‍ය නොවේ.

31. පොලිතීන් ගෘහ සකස් කිරීමේ දී හා නඩත්තුවේ දී පහත උපක්‍රම භාවිත වේ.
A - වහළයේ මුදුන මට්ටම් දෙකකට සැකසීම
B - විසුරුම් භාවිතයෙන් මීදුමක් ලෙස ජලය යෙදීම
C - මුළු ගෘහයම දැල් වෙනුවට පොලිතීන්වලින් පමණක් ආවරණය කිරීම
D - පැති බිත්තිවල විදුලි පංකා සවි කිරීම

ඉහත උපක්‍රම අතරින් පොලිතීන් ගෘහය තුළ උෂ්ණත්වය පාලනයට හේතුවන උපක්‍රම වන්නේ,
(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි.
(3) B, C හා D පමණි. (4) A, B, C හා D යන සියල්ලම ය.

32. නිර්පාංශු වගාවේ 'ද්‍රව මාධ්‍ය තුළ වගාව' සඳහා සකස් කරනු ලබන ස්ටයිරෆෝම් පෙට්ටි පියනෙහි පැළ සහිත බඳුන් රඳවන සිදුරුවලට අමතරව තවත් සිදුරක් සකස් කරනුයේ
(1) උෂ්ණත්වය පාලනය සඳහා ය.
(2) විටින් විට ජලය යෙදීම සඳහා ය.
(3) පෙට්ටිය තුළට වාතය ඇතුළුවීම සඳහා ය.
(4) පෝෂක ද්‍රව්‍ය ඇතුළු කිරීම සඳහා ය.

33. බීජ සුප්තතාවට හේතුවන බීජාවරණයේ වර්ධන නිශේධක ද්‍රව්‍ය පවතින බීජ වර්ග වනුයේ
(1) තක්කාලි හා පැපොල් ය. (2) දඹල හා කජු ය.
(3) වැල් දොඩම් හා කරවිල ය. (4) ලාවුළු හා අඹ ය.

34. ශාක බද්ධ කිරීම සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - බද්ධ කිරීමේ දී ග්‍රාහකය හා අනුජය එකම කුලයට අයත් විය යුතු ය.
B - බද්ධ කිරීමේ දී අනුජය හා ග්‍රාහකය යන දෙකම උසස් ගුණාත්මක අස්වැන්නක් ලබා දෙන ශාක විය යුතු ය.
C - ග්‍රාහකයට ශක්තිමත් මූල පද්ධතියක් පැවතිය යුතු ය.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) A, B හා C යන සියල්ලම ය.

35. පාසලේ සිසුන් පිරිසක් විසින් සිදු කරන ලද බීජ ප්‍රරෝහණයට අදාළ පරීක්ෂණයක දී පහත රූපයේ ආකාරයට බීජ වර්ග කිහිපයක් ප්‍රරෝහණය වී තිබුණි.



රූපයේ දැක්වෙන ආකාරයේ ප්‍රරෝහණයක් පෙන්නුම් කරන බීජ වන්නේ,
(1) බෝංචි හා මුං ය. (2) වී හා මිරිස් ය. (3) බඩඉරිඟු හා වම්බටු ය. (4) කඩල හා වී ය.

36. බීජ ප්‍රතිකාර ක්‍රම කිහිපයක් පහත දැක්වේ. එහි අරමුණ හා ක්‍රියාව නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | අරමුණ | ක්‍රියාව |
|---|---|---|
| (1) | බොල් බීජ ඉවත් කිරීම | බීජ තනුක සල්ෆියුරික් අම්ලයේ ගිල්වීම |
| (2) | රෝග වැළැක්වීම | කෘමිනාශක සමග මිශ්‍ර කිරීම |
| (3) | බීජවල සුප්තතාව ඉවත් කිරීම | ඝන බීජාවරණ ඉවත් කිරීම |
| (4) | කෘමි හානි වැළැක්වීම | දිලීරනාශක සමග මිශ්‍ර කිරීම |

**37.** ආහාර නරක් වීම සම්බන්ධයෙන් පහත දක්වා ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද
(1) ඇෆ්ලටොක්සීන් යනු පිළිකා ඇති කිරීමට හේතුවන බැක්ටීරියා වර්ගයකි.
(2) මඤ්ඤොක්කා අලවල ලිනමරීන් නම් ශරීරයට අහිතකර සංයෝගය අන්තර්ගත වේ.
(3) ජෑම් හා කෝඩියල්වලට යොදන සෝඩියම් නයිට්‍රේට් මගින් ආහාර පරිරක්ෂණය කර ගත හැකි ය.
(4) ඔක්සිකරණය නිසා සංතෘප්ත මේද අම්ල සහිත ආහාර මුඩුවීම සිදු වේ.

**38.** ආහාර ඇසුරුමක ප්‍රධාන රාමුවේ/ ලේබලයේ අන්තර්ගත විය යුතු ප්‍රධාන කරුණු තුන වන්නේ
(1) පොදු නාමය, නිෂ්පාදනයේ වෙළඳ නාමය, නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය වේ.
(2) පොදු නාමය, නිෂ්පාදනයේ වෙළඳ නාමය සහ ශුද්ධ අන්තර්ගතයේ බර හෝ පරිමාව වේ.
(3) පොදු නාමය, නිෂ්පාදකයාගේ නම, ලිපිනය සහ ගබඩා කිරීම පිළිබඳ උපදෙස් වේ.
(4) නිෂ්පාදනයේ වෙළඳනාමය, ශුද්ධ අන්තර්ගතයේ බර හෝ පරිමාව සහ කල් ඉකුත්වීමේ දිනය වේ.

**39.** බාල කරන ලද එළකිරි හඳුනාගැනීමේ පරීක්ෂාවක දී එළකිරි නියැදියකට ග්ලිසරින් බිංදුවක් එක් කළ විට රතු පැහැයක් ඇති විය. එළකිරිවලට මිශ්‍ර කර ඇති අපමිශ්‍රකාරකය විය හැක්කේ
(1) ජලය ය. (2) පොල්කිරි ය. (3) තිරිඟු පිටි ය. (4) යොදය ඉවත් කළ කිරිපිටි ය.

**40.** බෝග වගාවේ දී අනුගමනය කරනු ලබන ගොවිතැන් පද්ධතියක් වන 'සංරක්ෂණ ගොවිතැන' පිළිබඳ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පොහොර සහ බලශක්තිය සඳහා වැයවන පිරිවැය අවම කර ගත හැකි ය.
(2) අනෙකුත් ගොවිතැන් පද්ධතිවලට වඩා භූමියේ පාංශු ඛාදනය වැඩි ය.
(3) එක් නිෂ්පාදනයක අතුරු ඵලයක් අනෙක් නිෂ්පාදනයේ යෙදවුමක් ලෙස භාවිත වේ.
(4) පස, ජලය, පෝෂක සහ ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි අවම යෙදවුම් භාවිත කරමින් සිදු කෙරේ.

iruonline.com